**ඒඩ්ස්,ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය යටතේ වූ සංරචකය - 2020**

------------------------------------------------------------------------------------------------------------------------------------

ඒඩ්ස්,ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ ක්ෂය රෝග නව මූල්‍යයනය ආකෘතිය යටතේ වූ සංරචකයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය සහ ව්‍යාපෘතියේ කාලය

ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයවීමේ නියෝජිත ආයතනය වේ. ශ්‍රී ලංකාව තුළ ක්ෂය රෝග මර්දනය කිරීමේ වැඩ සටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්ෂය රෝග නව මූල්‍යයනය ආකෘතිය නමින් ක්ෂය රෝග සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවය රු. මිලියන 453.69 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 2.9 ක් වන අතර එය ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව පිළිබඳ ගෝලීය අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරිමේ දිනය 2024 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මි | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී රඳවාගත් ඉපැයීම් ගිණුමේ දැක්වෙන ශේෂය සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 6.0 | රඳවාගත් ඉපැයීම්/අලාභ වසරින් වසර ස්ථාවරව පවතී. මෙයට මූලික වශයෙන් හේතුවන්නේ ගිණුම්කරණ පද්ධතියයි. මේ සඳහා මුදල්මය වටිනාකමක් නොමැත. | විගණනයට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | විගණනයට ඉදිරිපත් කරන ලද 3.2 උපලේඛන හා සැසඳීමේ දී, ගෝලීය අරමුදලේ ඍජු විසර්ජන ගිණුම් ශේෂය සහ දේපල පිරියත සහ උපකරණ ගිණුම් ශේෂය අතර වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ නොවේ. අපට වෙනස වාර්තා කිරීමට නොහැකි වන අතර, විගණනය සඳහා ඉදිරිපත් කළ ලේඛන 2020 මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන සංඛ්‍යා මෙන්ම දේපළ, පිරියත සහ උපකරණවල සාරාංශය සහ ක්ෂයවීම් සමඟ ගැලපේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 756, | සෑම වසරකම දෙසැම්බර් 31 හෝ ඊට ආසන්න දිනකදී වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පත් කළ යුතුය.කෙසේ නමුත් වැලිසර රෝහල, දිවයින පුරා ළය ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ අනෙකුත් සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා ලබා දී තිබුණු රු. මිලියන 549ක වටිනාකමකින් යුත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබුණි. | වත්කම් සත්‍යාපන කටයුතු සඳහා වූ ක්‍රියාකාරකම් අයවැය ගෝලීය අරමුදල විසින් අනුමත කර නොමැත. එබැවින් සත්‍යාපන කටයුතු කිරීමට අපට ගෝලීය අරමුදල වෙතින් අරමුදල් නොතිබුණි. මේසඳහා අරමුදල් ඉල්ලා ඇති නමුත් ගෝලීය අරමුදල මඟින් ලබා දුන්නේ නැත. කෙසේ වෙතත්, වත්කම් සත්‍යාපන කටයුතු වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා HIV ප්‍රදානය සමඟ කිරීමට ව්‍යාපෘති කාර්යාලය තීරණය කළේය. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 1/2019දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ එක් වරක් පමණක් රැස්වී තිබුණි. | පිළිගනිමි. කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයක් තිබුණි. කෙසේ වෙතත්, බොහෝ සාකච්ඡා මාර්ගගතව පවත්වන ලද අතර, මාසික පදනමින් ප්‍රගතිය නිරීක්ෂණය කළේය. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |
| (ඇ) | 2007 අගෝස්තු 07 දිනැති අංක MOFP/ERD/2007/2දරනමුදල් අමාත්‍යාංශය චක්‍රලේඛය. | මුදල් වර්ෂය අවසානයේ සිට මාස දෙකක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 02ක් ප්‍රමාද වී එනම්, 2023 ජනවාරි 13 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | මෙය මූලික වශයෙන් මාර්ගෝපදේශවල වෙනස්වීම් නිසා සිදුවිය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් මුලින් බාහිර විගණකවරුන් සඳහා මෙන්ම රජය සඳහාද එකම මූල්‍ය ප්‍රකාශන සකස් කළේය. කෙසේ වෙතත්, 2019 වර්ෂයේ සිට, මූල්‍ය අංශය විසින් | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයතන දෙක සඳහා වෙන වෙනම ගිණුම් දෙකක් සකස් කළ යුතු බව සඳහන් වේ.රජයේ විගණනය සඳහා නම් කරන ලද සමාන ගිණුම් සකස් කළ හැකි බව ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය සඳහන් කර තිබුණි.කෙසේ වෙතත්, සාකච්ඡා කිහිපයකින් පසුව, 2022 දෙසැම්බර් මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය කැඳවා තිබූ රැස්වීමකදී ගිණුම් කට්ටල දෙකක් සකස් කිරීමට එකඟ විය. කාර්යමණ්ඩල හිගකම සහ අධික වැඩ රාජකාරී හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් කාර්යයන් කළමනාකරණය කරමින් සිටින අතර 2023 වර්ෂයේ සිට මෙම මාර්ගෝපදේශය අනුගමනය කරමි. | |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්ෂය රෝග මර්දන වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘති කටයුතු සඳහා අවස්ථා 52 කදී ලබාදී තිබූ රු.මිලියන 2.5ක් අදාළ කටයුතු සඳහා යොදා නොගෙන දීර්ඝ කාලයක් අත රදවාගෙන තිබුණි. | පිලිතුරු සපයා නොමැත. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර අරමුදල් ලෙස (GOSL) ලැබුණු රු. මිලියන 2.7කින් මිලියන 0.13 ක් වියදම් කර තිබූ අතර ලැබුණු මුදලින් සියයට 95 ක් නැවත භාණ්ඩාගාරය වෙත යවා තිබුණි. දේශීය අරමුදල්වලින් බදු සහ පාරිතෝෂික පමණක් ගෙවන බැවින් දේශීය අරමුදල්වල අවශ්‍යතාව නිසි ලෙස හඳුනා නොගෙන භාණ්ඩාගාර අරමුදල් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි.වැය අංක 17 සමාලෝචනය කර භාණ්ඩාගාරයවෙතින් අරමුදල් ඉල්ලා සිටියෙමු, කෙසේ වෙතත්, සැබෑ වියදම මුලින් යෝජනා කළ මුදලට වඩා අඩු විය. සැලසුම් කළ ක්‍රියාකාරකම්වලින් බහුතරයක් සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර බදු ගෙවීමේ කාර්ය සඳහා ලබාගත් අරමුදල් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී. ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය මෙහි වගකීම භාරගත යුතුය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නියමිත කාලය තුළ රැස්කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | මාතර දිස්ත්‍රික් කාර්යාලයේ වැඩසටහන් 7ක් සඳහා රු. 219,750ක් ලබා දී තිබූ අතර, ඉන් වැඩසටහන් 3ක් පමණක් ක්‍රියාත්මක කර රු.116,200ක් ආපසු එවා තිබුණි. | එකඟ වෙමි. මේ සඳහා පැහැදිලි කිරීමේ ලිපි ඉදිරිපත් කරන ලෙස ප්‍රදේශයේ අදාළ නිලධාරියාට දැනුවත් කරන ලද අතර වැඩිදුර පැහැදිලි කිරීම් ලිපියේ, පිටපත අමුණා ඇත. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නියමිත කාලය තුළ රැස්කර අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.2 මතභේදාත්මක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ක්ෂය රෝග මර්දන වැඩසටහන මගින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් 39දෙනෙකු සඳහා 2020 ජුලි 27 සිට 2020 අගෝස්තු 01 දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී දින 06 ක (GIS සහ යෙදුම්) පුහුණු වැඩමුළුවක් පවත්වා තිබුණු අතර,මේ සඳහා රු. මිලියන 1.4 ක් වැය කර තිබුණි. මෙම පුහුණු වැඩසටහනට සහභාගි වූ නිලධාරීන්ගේ පැමිණීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සහභාගිවූවන්ගේ කණ්ඩායම් රැස්වීම්පිළිබඳ සාක්ෂි, ලේඛනවල ඇතුළත් වේ. අදාළ බලධාරීන් සම්බන්ධ කර ගෙන පැමිණීමේ ලේඛණ ලබා ගෙන විගණනයට ඉදිරිපත් කරමි. | විගණනයට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |